සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

2949

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

| ශ්‍රේණිය / தரம் / Grade | භූගෝල විද්‍යාව - I, II | කාලය / நேரம் / Time |
|---|---|---|
| 8 ශ්‍රේණිය | | පැය දෙකයි |

නම / பெயர் / Name ......................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .........................

## I පත්‍රය

- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

1) ග්‍රහක වළල්ලෙන් පිටත පිහිටි ග්‍රහලෝක ................................ ග්‍රහලෝක ලෙස හඳුන්වයි.
( අභ්‍යන්තර / බාහිර / ගෝලාකාර )
2) පෘථිවියේ ධ්‍රැව විෂ්කම්භයට වඩා සමක විෂ්කම්භය ................................ ය.
( සමාන / වැඩි / අඩු )
3) ග්‍රිනිච් මධ්‍යාහ්න රේඛාව දේශාංශ ................................ ලෙස හඳුන්වයි. ( $0^0$ / $180^0$ / $23.5^0$)
4) පෘථිවි තලයෙහි ................................ ජලයෙන් වැසී පවතී. ( 70% / 29% / 71% )
5) භූමියේ සමාන උස ඇති ස්ථාන එකට සම්බන්ධ කරමින් ................................ රේඛා ඇඳ ඇත.
( සමාන්තර / සමගැඹුරු / සමෝච්ච)

- අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

6) ආලෝකය හා තාපය නිකුත් කරන ශක්ති ප්‍රභවයක් සහිත ආකාශ වස්තු තාරකා වේ. ( )
7) සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධාන ග්‍රහලෝක නවයකි. ( )
8) ජාත්‍යන්තරව පිළිගත් වෙලාවක් භාවිත කිරීම සඳහා පෘථිවිය සම්මත වේලා කලාප 24කට බෙදා ඇත. ( )
9) ඕසෝන් ස්තරය මගින් පාරජම්බුල කිරණ පෘථිවිය මත පතිත වීම පාලනය කෙරේ. ( )
10) සුන්දරබාන්ස් වගුරු බිම පිහිටා ඇත්තේ බංගලාදේශයේ ය. ( )

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

11) ඝන පාෂාණවලින් නිර්මාණය වී ඇති නිශ්චිත හැඩයක් නොමැති විවිධ විශාලත්වයෙන් යුත් අභ්‍යවකාශ වස්තු ................................ ලෙස හඳින්වේ.
12) පෘථිවියේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන ................................ පමණ වේ.
13) ජලය ගොඩබිම හා වායුගෝලය අතර චක්‍රීයව සංසරණය වීමේ ක්‍රියාවලිය ................................ චක්‍රය ලෙස හඳුන්වයි.
14) දකුණු ආසියානු කලාපයේ කඳුකර භූ දර්ශනයට අයත් ලක්ෂණ දැකිය නොහැකි රට ................................ යි.
15) ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියමේ සමෝච්ච රේඛා අන්තරය මීටර් ................................ කි.

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16) ග්‍රහලෝක අතරින් අධිකතම ගුරුත්වාකර්ෂණ බලයක් හිමි ග්‍රහලෝකය වන්නේ,
1) බුධ ය. 2) සිකුරු ය. 3) බ්‍රහස්පති ය. 4) පෘථිවිය ය.

17) විශ්වය නිරීක්ෂණය කිරීම සඳහා දුරදක්නය මුලින් ම භාවිත කරනු ලැබුවේ කවුරුන් විසින්ද?
1) ගැලීලියෝ ගැලිලි 2) නිකොලස් කොපර්නිකස්
3) ජොහැන්නස් කෙප්ලර් 4) ක්ලෝඩියස් ටොලමි

18) වායුගෝලයේ බහුලව ඇති වායුව වන්නේ,
1) නයිට්‍රජන් ය. 2) කාබන්ඩයොක්සයිඩ් ය. 3) ඔක්සිජන් ය. 4) ආගන් ය.


19) දකුණු ආසියානු කලාපයේ පිහිටුවා ඇති දේශපාලන සංවිධානයක් වන සාර්ක් සංවිධානයට ඇතුළු කරගෙන ඇති මධ්‍යම ආසියාතික රට වන්නේ,
1) ශ්‍රී ලංකාව යි. 2) ඇෆ්ගනිස්ථානය යි. 3) ඉන්දියාව යි. 4) මාලදිවයින යි.

20) වැලිතලා සහිත පැතිරුණු භූමිය, මිලිමීටර 250ට අඩු වර්ෂාපතනය, අධික වාෂ්පීකරණයක් හා උෂ්ණත්වයක් පැවතීම දැකිය හැකි භූ දර්ශනය කුමක් ද?
1) කඳුකර භූ දර්ශනය 2) නිම්න භූ දර්ශනය
3) වෙරළබඩ භූ දර්ශනය 4) කාන්තාර භූ දර්ශනය (ලකුණු 2x20=40)

## II පත්‍රය


- මෙහි පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතුය.
- ප්‍රශ්න අංක 02 සිට 07 තෙක් දී ඇති ප්‍රශ්න අතුරින් ප්‍රශ්න හතරක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1) (අ) පහත දී ඇති දකුණු ආසියානු කලාපීය සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i) සිතියමෙහි A, B, C, D අක්ෂරවලින් දැක්වෙන රටවල් අනුපිළිවෙලින් නම් කරන්න. (ලකුණු 4)
ii) E හා F අක්ෂරවලින් දැක්වෙන ප්‍රදේශ නම් කරන්න. (ලකුණු 2)
iii) H අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න. (ලකුණු 1)
iv) G අක්ෂරයෙන් දැක්වෙන ලක්ෂණය නම් කරන්න. (ලකුණු 1)
v) පහත දැක්වෙන රටවල අගනුවරවල් ලියා දක්වන්න.
(a) භූතානය (b) ශ්‍රී ලංකාව (ලකුණු 2)

(ආ) පහත දී ඇති භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i) සිතියමෙහි A - B රේඛාවෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
ii) C - D රේඛාවෙන් දැක්වෙන ලක්ෂණය කුමක් ද?
iii) E - F රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක් ද?
iv) G - H රේඛාවෙන් දැක්වෙන ලක්ෂණය නම් කරන්න.
v) කඩ ඉරිවලින් දක්වා ඇති භූ ලක්ෂණය කුමක් ද? (ලකුණු 2 x 5 = 10 )

2) (i) වාමන ග්‍රහලෝක යන්න හඳුන්වන්න. (ලකුණු 2)
(ii) දැනට හඳුනාගෙන ඇති වාමන ග්‍රහලෝක තුනක් නම් කරන්න. (ලකුණු 3)
(iii) (a) සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ බැඳී පවතින විශ්වාස තුනක් ලියා දක්වන්න.
(b) සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ නව දැනුම ගවේශණය කරනු ලබන ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටුවා ඇති ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 5)




Scanned with CamScanner

3) (i) දිවා රාත්‍රී ඇති වීම, ඍතුවල ප්‍රාදේශීය වෙනස්කම්, පෘථිවියේ කවර ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ද?. (ලකුණු 2)

(ii) (a) යාබද රූප සටහනේ X හා Y වලින් දැක්වෙන ලක්ෂ දෙක පිළිවෙලින් නම් කරන්න.

(b) X - Y රේඛාව නම් කරන්න. (ලකුණු 3)

(iii) යාබද රූප සටහනේ A, B, C, D හා E අක්ෂරවලින් දැක්වෙන රේඛා නම් කරන්න. (ලකුණු 5)




4) (i) පෘථිවියේ ජලය පවතින ප්‍රධාන ආකාර දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ජලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) (a) ජලය දූෂණයට හේතුවන මානුෂ ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න.

(b) ජල දූෂණය වැළැක්වීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

5) (i) දකුණු ආසියානු කලාපයේ සාපේක්ෂ පිහිටීම සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (a) දකුණු ආසියානු කලාපයේ වෙරළ තීරයක් නොමැති රටවල් දෙකක් නම් කරන්න.

(b) එම කලාපයට අයත් දූපතක් නම් කරන්න. (ලකුණු 3)

(iii) (a) දකුණු ආසියානු කඳුකර භූ දර්ශන කලාපයේ ජීවත්වන ගෝත්‍රික ජන වර්ග දෙකක් නම් කරන්න.

(b) එම ගෝත්‍රික ජනතාවගේ විශේෂ ශාරීරික ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 5)

6) (i) දකුණු ආසියානු කලාපයේ වෙරළබඩ භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) වෙරළබඩ භූ දර්ශනය තුළ දැකිය හැකි සුවිශේෂී පරිසර පද්ධති තුනක් නම් කරන්න. (ලකුණු 3)

(iii) (a) මාලදිවයිනේ සංචාරක කර්මාන්තය දියුණු වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් සඳහන් කරන්න.

(b) වෙරළබඩ කලාපයේ පාරිසරික ගැටලු ඇතිවීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 5)

7) (i) නාගරික භූ දර්ශනයේ ජනයා නගර කරා ඒකරාශි වීමට හේතු වී ඇති කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) දකුණු ආසියාවේ නාගරික භූ දර්ශනය දැකිය හැකි නගර තුනක් නම් කරන්න. (ලකුණු 3)

(iii) (a) "බොලිවුඩ්" නමින් ලොව ප්‍රචලිත වී ඇති නගරයේ නාගරික භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(b) එම නගරය තුළ දැකිය හැකි ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 5)



Scanned with CamScanner

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු
Department of Education, Southern Province Department of Education, Southern Province

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**තෙවන වාර පරීක්ෂණය –2023 (2024)**

**8 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව – පිළිතුරු පත්‍රය**

## I කොටස

1. බාහිර
2. වැඩි
3. $0^0$
4. 71%
5. සමෝච්ච
6. √
7. ×
8. √
9. √
10. √
11. ග්‍රහක/ ග්‍රහාංශු
12. 510
13. ජල
14. මාලදිවයින
15. 20
16. බ්‍රහස්පති
17. ගැලීලියෝ ගැලීලි
18. නයිට්‍රජන්
19. ඇෆ්ගනිස්ථානය
20. කාන්තාර භූ දර්ශනය

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

(01) (අ) (i) A- ඉන්දියාව B- නේපාලය C- පාකිස්ථානය D - මාලදිවයින

(ii) E- බෙංගාල බොක්ක F- අරාබි මුහුද

(iii) ගංගානම් ගඟ

(iv) G- පෝක් සමුද්‍ර සන්ධිය

(v) භූතානය - තිම්පු ශ්‍රී ලංකාව - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ (ලකුණු 10)

(ආ) (i) නිම්නය (ii) නෙරුව

(iii) කොත්කන්ද (iv) කපොල්ල

(v) කඳුවැටිය (ලකුණු 10)

(02) (i) නිශ්චිත කක්ෂ තලයක් හඳුනාගත නොහැකි සහ ප්‍රමාණයෙන් කුඩා ග්‍රහලෝක වාමන ග්‍රහලෝක ලෙස හඳුන්වයි. (ලකුණු 02)

(ii) ප්ලූටෝ / එරිස් / සෙරිස් / මාකේ මාකේ / හෝමියා (ලකුණු 03)

(iii) (a) - හිරු සඳු දේවත්වයෙන් සළකා වන්දනාමාන කිරීම

- හිරු, සඳු සහ ග්‍රහයන් පදනම් කරගෙන ජ්‍යොතිර් විද්‍යාව නිර්මාණය වී තිබීම.

- ග්‍රහ බලපෑමෙන් අපල උපද්‍රව සිදුවේ යන විශ්වාසය මත ග්‍රහ ශාන්ති කර්ම පැවැත්වීම.

- උපන් වේලාවේ ග්‍රහ පිහිටීම සළකා ජන්ම පත්‍ර සකස් කිරීම.

- හිරු, සඳු පදනම් කරගත් විවිධ උත්සව ජන සමාජය තුළ දක්නට ලැබීම.

උදා- තෛපොංගල්/ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද / රාමලාන් උත්සවය

- ශ්‍රී ලංකාවේ සාම්ප්‍රධායික ගොවිතැන් කටයුතු හිරු සඳු බලපෑම මත සංවිධානය වී තිබීම.

- ආයුර්වේද ප්‍රතිකාර සඳහා යොදා ගන්නා ශාක කොටස් ලබා ගැනීමේ දී දිශාව සැළකීම හා සඳුගේ බලපෑම ඇතැයි පවතින විශ්වාසය

(b) නාසා ආයතනය / කැල්ටෙක් තාරකා විද්‍යා ආයතනය (ලකුණු 05)

(03) (i) පෘථිවියේ භ්‍රමණය (ලකුණු 02)

(ii) (a) x - උත්තර ධ්‍රැවය y- දක්ෂිණ ධ්‍රැවය / දකුණු ධ්‍රැවය

(b) අක්ෂ රේඛාව (ලකුණු 03)

(iii) A - ආක්ටික් වෘත්තය B - කර්කටක නිවර්තනය

C - සමකය D - මකර නිවර්තනය

E - ඇන්ටාක්ටික් වෘත්තය (ලකුණු 05)

(04) (i) ඝන / ද්‍රව / වායු (ලකුණු 02)

(ii) - ගෘහස්ත කටයුතු - කෘෂිකාර්මික කටයුතු

- ප්‍රවාහනය - විදුලිබල උත්පාදනය

- විවිධ කර්මාන්ත - විනෝද කටයුතු

මින් එක් කරුණක් යටතේ කරුණු දක්වා ඇතත් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

(iii) (a) - ජල මාර්ගවලට කැළිකසල බැහැර කිරීම.

- කර්මාන්තශාලාවලින් ඉවතලන අපද්‍රව්‍ය ජල මාර්ගවලට මුදා හැරීම.

- කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගන්නා විවිධ කෘමිනාශක, වල්නාශක ආදිය පාවිච්චියෙන් පසු ජල මාර්ගවලට මුදා හැරීම.

ආදී පිළිගත හැකි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(b) පිළිතුර සළකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(05) (i) උතුරින් - හිමාලය කඳු දකුණින් - ඉන්දියන් සාගරය

නැගෙනහිරින් - බෙංගාල බොක්ක බටහිරින් - අරාබි මුහුද (ලකුණු 02)

(ii) (a) නේපාලය / භූතානය

(b) මාලදිවයින/ අන්දමන්/ නිකොබාර් (ලකුණු 03)

(iii) (a) භූටියා / කසා / දරඩ් / ලෙප්චා / ෂෙර්පා

(b) - කඳු නැගීමට හැකිවන ලෙස ශක්තිමත්ව පිහිටි පැතලි පතුල් සහිත පාද

- බර ඉසිලීමට හැකි ලෙස ශක්තිමත් වූ බාහු

- අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත් වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු පිහිටා තිබීම

(ලකුණු 05)

(06) (i) වැලිපර / කලපු / බොකු / තුඩු / කොරල්පර / කඩොලාන ආදී....... (ලකුණු 02)

(ii) තෙත් බිම්/ කඩොලාන / වගුරු (ලකුණු 03)

(iii) (a) - රක්ෂිත කලපු හා හුදකලා දූපත්වලින් සැදුම් ලත් ස්වාභාවික වරාය

- කොරල්පර සහිත නොගැඹුරු මුහුද

- වෙරළ ආශ්‍රිතව පවතින ජෛව විවිධත්වය

- හිරු එළිය විඳගත හැකි ස්ථාන බහුල වීම

- පැහැදිලි ජලය

- දර්ශනීය සුදු වැලිතලා සහිත වෙරළ

- සංචාරක ආකර්ශනය ඇතිවන පරිදි සකසි කළ හෝටල් පහසුකම්

(b) - අනවසර ඉදිකිරීම්. - වැලි ගොඩ දැමීම.

- හිරිගල් කැඩීම. - මුහුදට අපද්‍රව්‍ය දැමීම ආදී........ (ලකුණු 05)

(07) (i) මාර්ග ජාල / සන්නිවේදන ජාල / වාසස්ථාන / පරිපාලන මධ්‍යස්ථාන / ඉදිකළ ප්‍රදේශ

(ලකුණු 02)

(ii) මුම්බායි / දිල්ලිය / චෙන්නයි / කොල්කටා / ඉස්ලාමාබාද් / කරච්චිය / කොළඹ (ලකුණු 03)

(iii) (a) - වෙරළබඩ තැන්තලා ප්‍රදේශයක පිහිටි මුම්බායි නගරය ස්වාභාවික වරායක් ලෙස වර්ධනය වූ නගරයකි.

- ඉන්දියාවේ දෙවන විශාලතම නගරය

- සීමිත බිමක අධික ජන සංඛ්‍යාවක් වාසය කිරීම

- කර්මාන්ත හා සේවා කටයුතු වර්ධනය වී තිබීම

- නිවාස ඝනත්වය අධික වීම

- තට්ටු නිවාස සංකීර්ණ දැකිය හැකි වීම

- සැලැස්මකින් තොරව ඉදි වී ඇති පහසුකම් අඩු ජනාවාස

- දෛනික සවලතාව ඉතා අධිකය

(b) - ඉඩම් හිඟය - මාර්ග තදබදය

- අඩු ආදායම් ජනාවාස බහුල වීම - වීදි ජනයා බහුල වීම

- පරිසර දූෂණය - අපචාර බහුල වීම (ලකුණු 05)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න